**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**කොළඹ**

*******

**<u>පුවත්පත් නිවේදනය</u>**

ස්වයං මූල්‍ය යෝජනා ක්‍රමය

ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික සිසුන්ගෙන් (ඉන්දියානු සම්භවයක් ඇති පුද්ගලයන්, OCI කාඩ්පත් හිමියන් සහ අනේවාසික ඉන්දියානුවන් හැර) ස්වයං මූල්‍ය යෝජනා ක්‍රමය යටතේ 2020-21 අධ්‍යයන වර්ෂය සඳහා MBBS, BDS, BE, B.Tech, B.Pharm සහ B.Arch යන උපාධි පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවනු ලබන දිනය ජුලි 31 දක්වා දීර්ඝ කර ඇත.

2. MBBS / BDS පාඨමාලා සඳහා අයදුම් කිරීමට අපේක්ෂා කරන සිසුන් 2020 සැප්තැම්බර් 13 වන දින ජාතික පරීක්ෂණ ඒජන්සිය (NTA) විසින් පවත්වනු ලබන NEET පරීක්ෂණයෙන් අවම ලකුණු 50 ක් ලබා ගත යුතු වේ. B.Arch අපේක්ෂකයින් නවදිල්ලියේ ගෘහ නිර්මාණ කවුන්සිලය විසින් නියම කරන ලද පරීක්ෂණය සමත් වීම අවශ්‍ය වේ. NEET පරීක්ෂණයේ ප්‍රතිඵල සටහනෙහි පිටපතක් එය ලබා ගැනීමෙන් අනතුරුව ඉදිරිපත් කළ යුතුය.

3. උනන්දුවක් දක්වන අපේක්ෂකයින් සතියේ ඕනෑම වැඩ කරන දිනයක පැය 1400-1600 අතර ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ අධ්‍යාපන අංශයට තම අ.පො.ස සාමාන්‍ය පෙළ හා උසස් පෙළ සහතික (විභාග දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල විසින් නිකුත් කරනු ලබන) හෝ ලන්ඩන් සාමාන්‍ය හා උසස් පෙළ සහතික සහ උප්පැන්න සහතිකය ඉදිරිපත් කර අයදුම්පත් ලබාගත යුතුය.

*****

කොළඹ

ශක වර්ෂ 1942 අශද 31

2020 ජුලි 22